# පුරප්පාඩු

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

## පුස්තකාල සහායක තනතුර සඳහා බඳවා ගැනීම

01. මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සහායක III තනතුර සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2015 මැයි මස 11 දින හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති මාලිම්බඩ ප්‍රාදේශීය සභාව, තෙලිජ්ජවිල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

| | | | |
|---|---|---|---|
| 03. | **තනතුරු නාමය** | - | **පුස්තකාල සහායක** III |
| 04. | **පුරප්පාඩු සංඛ්‍යාව** | - | 01 |
| 05. | **අධ්‍යාපන සුදුසුකම්** | - | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 6 කින් සමත් විය යුතුය. |
| | | - | බඳවා ගැනීමේදී ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ. |
| 06. | **වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය** | - | 11730-10x110-10x120-10x130-10x145-10x160 - 17600 |
| 07. | **වයස් සීමාව** | - | වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය. |
| 08. | **බඳවා ගැනීමේ ක්‍රමය** | - | නියමිත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම. |

09. **බඳවා ගැනීමේ කොන්දේසි**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

II. අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට (2015.05.12) දිනට අවුරුදු 18 ට වැඩි 45 ට නොවැඩි විය යුතුය.

III. දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

IV. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් නොලැබූ අයෙකු විය යුතුය.

VI. රජයේ හෝ පළාත් පාලන සේවයේ සේවයෙන් පහ කළ අයෙකු නොවිය යුතුය.

VII. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ අතර කාල සීමාවේදී දකුණු පළාත් මෙම තනතුරු වලට අදාළ ව්‍යවස්ථා සංශෝධන බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය වීමද බඳවා ගැනීම, ප්‍රදාන කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

10. **සේවා නියුක්ත කරවීමේ කොන්දේසි**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

II. වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

III. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

IV. මෙම කොන්දේසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි සහ මුදල් රෙගුලාසි වලටද දකුණු පළාත් සභාව සහ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කරන රෙගුලාසි වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

11. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතිකය

II. අධ්‍යාපන සහතිකය

III. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්

IV. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය

V. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්

VI. පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික

12. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස **"පුස්තකාල සහායක තනතුර"** යනුවෙන් සඳහන් කළ යුතුය.

13. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.**